# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref.
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2020.02 19

චක්‍රලේඛ අංක - **09/2020**

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ,

**අ.පො.උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය ගුරු භවතුන් ස්ථානගත කිරීම.**

අ.පො.ස උසස් පෙළ තාක්ෂණවේදය විෂය ධාරාව ආරම්භයේ දී ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුභවතුන් (තාක්ෂණ) හා සුදුසුකම් ලත් තාක්ෂණික උපාධිධාරී ගුරු භවතුන් ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ඉගැන්වීම් සඳහා යොදවන ලද අතර තාක්ෂණික ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීමෙන් පසු ඔබගේ ද එකඟතාව පරිදි විෂය ක්‍රියාත්මක පාසල් සඳහා ඔවුන් පත්කර ඇත.

මෙලෙස පත්වීම් ලැබූ ගුරු භවතුන් වෙනත් විෂයන් ඉගැන්විම සඳහා 6 -11 ශ්‍රේණිවලට යොදවා තිබීම සහ ඔවුන් සිටිය දී වෙනත් ගුරු භවතුන් විෂය ඉගැන්වීමට යෙදවීමත් ඇතැම් පාසල්හි අතිරික්තව තබාගැනීමත් මඟින් මෙම විෂය ධාරාවට අදාළව පාසල් පද්ධතිය තුළ ගුරු පුරප්පාඩු ඇතිවන බව නිරීක්ෂණය වී ඇත. මේ තත්ත්වය වලක්වන ලෙස මා විසින් 2014.02.06 දිනැති ලිපියෙන් ද උපදෙස් ලබා දී ඇති බව ද අවධාරණය කරමි.

ඒ අනුව, අ.පො.ස උසස් පෙළ තාක්ෂණවේදය විෂය ධාරාවේ ගුරු භවතුන් සම්බන්ධයෙන් පහත දැක්වෙන පරිදි කටයුතු කළ යුතු වේ.

01. විෂය ධාරාවේ පන්ති සඳහා අනුමත ගුරු සංඛ්‍යාව පමණක් පාසල තුළ රඳවා ගත යුතු අතර විශේෂයෙන් ඉංජිනේරු තාක්ෂණවේදය විෂය යටතේ ගැනෙන විෂය කොටස් සඳහා වෙන වෙනම ගුරු භවතුන් නොයෙදවිය යුතු ය.
02. තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා ම පත්වීම් ලබා ඇති ගුරු භවතුන් එම පන්ති වල ඉගැන්වීම සඳහා යෙදවිය යුතු ය.
03. තාක්ෂණවේදය විෂය ධාරාවේ අනුමත කාලච්ඡේද සංඛ්‍යාව සඳහා යෙදවීමෙන් පසුව පමණක් ඉතිරි කාලච්ඡේදයන්හි වෙනත් විෂයන් ඉගැන්වීම සඳහා යොමු කරන ලෙස විදුහල්පතිවරුන් වෙත උපදෙස් ලබා දිය යුතු ය.
04. තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා පත්වීම් ලැබූ අනුමත ගුරු සංඛ්‍යාව ඉක්මවා ඇති ගුරු භවතුන් හැකි ඉක්මනින් තාක්ෂණවේදය විෂය ධාරාව ක්‍රියාත්මක පුරප්පාඩු සහිත පාසලක් වෙත ස්ථාන ගත කිරීමට පියවර ගත යුතු ය.
05. වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේදී තාක්ෂණවේදය විෂය ධාරාව ක්‍රියාත්මක පාසල්වලට පමණක් ස්ථාන මාරු කළ යුතු ය.

06. දැනට මෙම විෂය ධාරාව ක්‍රියාත්මක යම් පාසලකට ගුරු භවතුන් ස්ථාන මාරු කිරීමේදී විෂය ඉගැන්වීම අඛණ්ඩව සිදුවන බව තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් ස්ථාන මාරු කිරීමට වග බලා ගත යුතු ය.

දැඩි ගුරු ඌණතාවයක් සහිත අ.පො.ස උසස් පෙළ තාක්ෂණවේදය විෂය ධාරාව පිළිබඳ ඉහත කරුණු පිළිබඳ දැඩි අවධානයෙන් යුතුව කටයුතු කරන ලෙසත් ජාතික අවශ්‍යතාවක් සේ සලකා අදාළ ගුරු භවතුන් ස්ථාන ගත කිරීම් සිදු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

එන්.එච්.එම් චිත්‍රානන්ද
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -
(1). විගණකාධිපති
(2). සියලු ම පළාත් ලේකම්වරුන්
(3). ප්‍රධාන කොමසාරිස් (ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ)
(4). ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ගුරු ආයතන)
(5). අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්)
(6). අධ්‍යාපන අධ්‍යක්ෂ ( ගුරු ස්ථාන මාරු)
(7). සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,